243159

AL/2017/12/S

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

| | | |
|---|---|---|
| සාමාන්‍ය පොදු පරීක්ෂණය<br>பொதுச் சாதாரணப் பரீட்சை<br>Common General Test | **12 S** | පැය දෙකයි මිනිත්තු තිහයි<br>இரண்டு மணித்தியாலமும் முப்பது நிமிடமும்<br>Two hours and thirty minutes |

**උපදෙස්:**
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිලිමත් ව කියවන්න.
* 1 සිට 60 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** වසර 17 කට පසු ව 2016 වර්ෂයේ දී ශ්‍රී ලංකාව ටෙස්ට් ක්‍රිකට් තරගාවලියක දී ඕස්ට්‍රේලියාව පැරදවී ය. මෙම ටෙස්ට් ක්‍රිකට් තරගාවලියේ දී ශ්‍රී ලංකා කණ්ඩායමේ නායකත්වය දැරුවේ කවු ද?
(1) රංගන හේරත් (2) ඇන්ජලෝ මැතිව්ස් (3) උපුල් තරංග
(4) ලසිත් මාලිංග (5) දිනේෂ් චන්දිමාල්

**2.** ඇමෙරිකා එක්සත් ජනපදයේ වර්තමාන ජනාධිපතිවරයා කවු ද?
(1) ඩොනල්ඩ් ට්‍රම්ප් (2) බැරක් ඔබාමා (3) ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ්
(4) හිලරි ක්ලින්ටන් (5) ජෝන් මැකේන්

**3.** පහත සඳහන් විප්ලව අතුරෙන් කවරක් 2017 වර්ෂයේ දී සිය 100 වන සංවත්සරය සනිටුහන් කරයි ද?
(1) ප්‍රංශ විප්ලවය (2) ඉංග්‍රීසි විප්ලවය (3) ඇමෙරිකානු විප්ලවය
(4) රුසියානු විප්ලවය (5) බෙල්ජියම් විප්ලවය

**4.** ජයන්ති කුරු-උතුම්පාල පහත සඳහන් කුමන ක්‍රියාව සාක්ෂාත් කරගත් ප්‍රථම ශ්‍රී ලාංකිකයා වන්නී ද?
(1) එවරස්ට් කඳුමුදුන තරණය කිරීම (2) පෝක් සමුද්‍ර සන්ධිය හරහා පිහිනීම
(3) විම්බල්ඩන් ටෙනිස් ශූරතාව දිනා ගැනීම (4) ලන්ඩන් මැරතන් ධාවන තරගයෙන් ජය ලැබීම
(5) හිම්හාන ඔලිම්පික් තරගාවලියක දී රන් පදක්කමක් දිනා ගැනීම

**5.** 'බ්‍රෙක්සිට්' (Brexit) යන පදය සුලබ ව භාවිත කරනුයේ එක්සත් රාජධානිය එක්තරා සංවිධානයකින් ඉවත් වීමේ ක්‍රියාවලියට ය. එම සංවිධානයේ නම කුමක් ද?
(1) නොබැඳි ජාතීන්ගේ සංවිධානය (2) උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය
(3) එක්සත් ජාතීන්ගේ සංවිධානය (4) පොදු රාජ්‍ය මණ්ඩලය
(5) යුරෝපා සංගමය

**6.** 2017 වර්ෂයේ ජනවාරි මස ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍යවරයා ලෝක ආර්ථික සංසදයේ 47 වන වාර්ෂික රැස්වීමට සහභාගි වූයේ ය. එම රැස්වීම පැවැත්වූයේ,
(1) ස්විට්සර්ලන්තයේ ඩාවොස් හි ය. (2) ස්විට්සර්ලන්තයේ ජිනීවා හි ය.
(3) ස්විට්සර්ලන්තයේ සූරිච් හි ය. (4) බෙල්ජියමේ බ්‍රසල්ස් හි ය.
(5) ඉතාලියේ රෝමයේ ය.

**7.** 2016 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ දී මාලදිවයින එක්තරා සංවිධානයකින් ඉවත් වීමේ තීරණය ප්‍රකාශයට පත් කළේ ය. එම සංවිධානය,
(1) නොබැඳි ජාතීන්ගේ සංවිධානයයි. (2) එක්සත් ජාතීන්ගේ සංවිධානයයි.
(3) පොදු රාජ්‍ය මණ්ඩලයයි. (4) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලයි.
(5) කලාපීය සහයෝගීතාව පිළිබඳ දකුණු ආසියානු සංවිධානයයි.

**8.** ශ්‍රී ලංකාව එක්තරා රෝගයකින් නිදහස් බව 2016 සැප්තැම්බර් මාසයේ දී ලෝක සෞඛ්‍ය සංවිධානය ප්‍රකාශයට පත් කළේ ය. එම රෝගය කුමක් ද?
(1) මැලේරියා (2) ලාදුරු (3) බරවා
(4) ක්ෂයරෝගය (5) පෝලියෝ

**9.** පහත සඳහන් කුමන ලතින් ඇමෙරිකානු රට 2016 නොවැම්බර් මාසයේ දී FARC නමින් හැඳින්වෙන එම රටෙහි විශාලතම කැරලිකාර කණ්ඩායම සමග සාම ගිවිසුමකට එළඹුණේ ද?
(1) ආර්ජන්ටිනාව (2) කොලොම්බියාව (3) බොලිවියාව (4) චිලී (5) මෙක්සිකෝව

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

**10.** 1818 ජනවාරි මාසයේ 10 වැනි දින එවකට ශ්‍රී ලංකාවේ සිටි ආණ්ඩුකාරවරයා විසින් ඌව වෙල්ලස්ස කැරැල්ලේ නායකයින් 19 දෙනකු ද්‍රෝහීන් ලෙස නම් කරමින් ප්‍රසිද්ධ කරන ලද ප්‍රකාශය, 2016 දෙසැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා විසින් අවලංගු කරන ලදී. එම ප්‍රකාශය ප්‍රසිද්ධියට පත් කළ ආණ්ඩුකාරවරයාගේ නම කුමක් ද?
(1) රොබර්ට් බ්‍රවුන්රිග් (2) ෆෙඩ්රික් නෝර්ත් (3) එඩ්වර්ඩ් බාර්න්ස්
(4) විලියම් හෙන්රි ග්‍රෙගරි (5) ජෝන් ඇන්ඩර්සන්

**11.** නාසා (NASA) හි 'ජූනෝ' (Juno) අභ්‍යවකාශ යානය වසර පහක් තුළ කිලෝමීටර බිලියන 2.8 ක දුරක් ගමන් කිරීමෙන් පසු, පසුගිය වසරේ දී එක්තරා ග්‍රහලෝකයක කක්ෂයට පිවිසුණේ ය. එම ග්‍රහලෝකය කුමක් ද?
(1) සිකුරු (2) සෙනසුරු (3) අඟහරු (4) යුරේනස් (5) බ්‍රහස්පති

**12.** කළුගඟ මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සැලසුම් කරන ලද ජලාශ පහ අතුරෙන් අවසාන ජලාශය මෙම වසර ආරම්භයේ දී විවෘත කරන ලදී. එම ජලාශයේ නම කුමක් ද?
(1) කොත්මලේ (2) මොරගහකන්ද (3) වික්ටෝරියා
(4) රන්දෙනිගල (5) මාදුරු ඔය

**13.** ශ්‍රී ලංකාව තුළ උග්‍ර ගංවතුර තර්ජන හා නායයෑම් ඇති කරමින් 2016 වර්ෂයේ මැයි මාසයේ අයහපත් කාලගුණ තත්ත්ව ඇති කිරීමට හේතු වූයේ පහත සඳහන් කුමන සුළි කුණාටුව ද?
(1) නාඩා (2) ක්යාන්ට් (3) රෝනු (4) වියාරු (5) නීලම්


**14.** පළාත් පාලන කොට්ඨාශවල ඡන්ද පිළිබඳ වූ මායිම් නැවත ලකුණු කිරීම විමර්ශනය කිරීම සඳහා පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යවරයා විසින් පත් කරන ලද කමිටුව වන්නේ,
(1) අන්තර් අමාත්‍යාංශ කමිටුවයි. (2) පිළිගත් පුද්ගල ජාත්‍යන්තර ස්වාධීන කණ්ඩායමයි.
(3) ජනාධිපති විමර්ශන කොමිසමයි. (4) සීමා නිර්ණය සමාලෝචන කමිටුවයි.
(5) අන්තර් ආයතනික උපදේශන කමිටුවයි.

**15.** මෑතක දී යුරෝපා සංගමය විසින් ශ්‍රී ලංකාවට GSP+ ප්‍රදානය කරන ලදී. මෙමගින් පහත සඳහන් කවරක් උදෙසා ඉඩ ලැබේ ද?
(1) යුරෝපා සංගමයට ශ්‍රී ලංකාව තුළ විකල්ප බලශක්ති ප්‍රභව ප්‍රවර්ධනය කිරීමට
(2) යුරෝපා සංගමයේ නිෂ්පාදනවලට තීරු බදු රහිත ව ශ්‍රී ලංකා වෙළෙඳපොළට පැමිණීමට
(3) යුරෝපා සංගමයේ වෙළෙඳ සමාගම්වලට ශ්‍රී ලංකාව තුළ ක්‍රියා කිරීමට
(4) යුරෝපය සහ ශ්‍රී ලංකාව අතර සංක්‍රමණය වන කුරුලු විශේෂ සංරක්ෂණය කිරීමට
(5) ශ්‍රී ලංකාවේ සමහර අපනයන භාණ්ඩ සඳහා යුරෝපා සංගමයට අඩු තීරු බදු ගෙවීමට හෝ තීරු බදු නොගෙවීමට

**16.** 2017 වර්ෂයේ සඳුදා දිනක නවීන් තම උපන් දිනය සැමරුවේ ය. ඔහු තමාගේ ඊළඟ උපන් දිනය සමරන්නේ කුමන දිනක ද?
(1) ඉරිදා දිනක (2) සඳුදා දිනක (3) අඟහරුවාදා දිනක
(4) බදාදා දිනක (5) බ්‍රහස්පතින්දා දිනක

**17.** මීටර 1800 ක ගමන් මාර්ගයක දෙකෙළවර $A$ හා $B$ ලෙස ලකුණු කර ඇත. එක ම මොහොතක, ලහිරු $A$ ස්ථානයෙන් ආරම්භ කර $4\ \text{km h}^{-1}$ ක වේගයෙන් $B$ දෙසට ගමන් කරන අතර, ටිනා $B$ ස්ථානයෙන් ආරම්භ කර $5\ \text{km h}^{-1}$ ක වේගයෙන් $A$ දෙසට ගමන් කරයි. ඔවුන් එකිනෙකා මුණගැසෙන්නේ $A$ සිට කොපමණ දුරක දී ද?
(1) 360 m (2) 450 m (3) 500 m (4) 800 m (5) 1000 m

**18.** $ABCD$ යනු පැත්තක දිග 6 m වන සමචතුරස්‍රයකි. $AE = 1$ m ද $HD = 2$ m ද $EFGH$ සෘජුකෝණාස්‍රයේ වර්ගඵලය $ABCD$ හි වර්ගඵලයෙන් $\frac{1}{3}$ ද නම්, $EF$ හි දිග




(1) 2.0 m වේ. (2) 3.0 m වේ. (3) 3.5 m වේ.
(4) 4.0 m වේ. (5) 5.0 m වේ.

**19.** එක්තරා පන්තියක සිටින ගැහැනු ළමයින් සංඛ්‍යාව හා පිරිමි ළමයින් සංඛ්‍යාව අතර අනුපාතය 7 : 3 කි. අලුතින් පිරිමි ළමයකු පන්තියට ඇතුළු වූ විට මෙම අනුපාතය 2 : 1 දක්වා වෙනස් වේ. පන්තියේ සිටින ගැහැනු ළමයින් සංඛ්‍යාව කීය ද?
(1) 12 (2) 14 (3) 16 (4) 18 (5) 20

**20.** 1 kg, 2 kg, 3 kg, 4 kg, 5 kg, 6 kg, 7 kg හා 8 kg වන පඩි අටක් එක් කාණ්ඩයකට පඩි හතර බැගින් වන සේ කාණ්ඩ දෙකකට වෙන් කළ යුතු වන්නේ එක් එක් කාණ්ඩයේ පඩිවල මුළු ස්කන්ධයන් සමාන වන පරිදි ය. මෙය සිදු කළ හැකි වෙනස් ආකාර ගණන කොපමණ ද?
(1) 0 (2) 1 (3) 2 (4) 3 (5) 4

**21.** හරිතාගාරයක ඇති ටැංකියකින් නියත ශීඝ්‍රතාවකින් ද්‍රව පොහොර නිදහස් කෙරේ. පෙ.ව. 6.00 ට ටැංකිය සම්පූර්ණයෙන් පොහොරවලින් පිරී තිබුණු අතර එම වේලාවේ එය පොහොර නිදහස් කිරීම ආරම්භ කළේ ය. එක්තරා කාලයකට පසු පියල් ටැංකිය පරීක්ෂා කිරීමේ දී ටැංකියෙන් $\frac{1}{4}$ ක් හිස්ව තිබුණි. ඊළඟ පැය අවසානයේ දී ටැංකියෙන් $\frac{1}{3}$ ක් හිස්ව තිබෙන බව ඔහු නිරීක්ෂණය කළේ ය. ටැංකිය සම්පූර්ණයෙන් ම හිස් වන්නේ කුමන වේලාවේ දී ද?
(1) පෙ.ව. 10.00 (2) ප.ව. 12.00 (3) ප.ව. 2.00 (4) ප.ව. 4.00 (5) ප.ව. 6.00



Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

● අංක **22** සහ **23** ප්‍රශ්න, පහත දී ඇති තොරතුරු මත පදනම් වේ.

එක්තරා ජංගම දුරකථන සමාගමක්, පිටතට ලබා ගන්නා ඇමතුම් සඳහා පහත ආකාරයට මුදල් අය කරයි.

* පළමු මිනිත්තුව සඳහා රු. 5
* දෙවන මිනිත්තුව සඳහා රු. 4
* තුන්වන මිනිත්තුව සඳහා රු. 3
* තුන්වන මිනිත්තුවෙන් පසු සෑම මිනිත්තුවක් සඳහා ම රු. 2 බැගින්

සෑම ඇමතුමක ම කාලය සටහන් කරන්නේ මිනිත්තුවලිනි.

**22.** මිනිත්තු 8ක ඇමතුමක් සඳහා අය කරන මුදල
(1) රු. 20 යි. (2) රු. 21 යි. (3) රු. 22 යි. (4) රු. 23 යි. (5) රු. 24 යි.

**23.** මුළු කාලය මිනිත්තු 5ක් වූ ඇමතුම් දෙකක් සඳහා පුද්ගලයකුගෙන් අය කිරීමට සිදු විය හැකි උපරිම මුදල
(1) රු. 18 යි. (2) රු. 19 යි. (3) රු. 20 යි. (4) රු. 21 යි. (5) රු. 22 යි.

**24.** සමාන පාදයක දිග 100 cm වන සමද්විපාද සෘජුකෝණී ත්‍රිකෝණයක් තුළ අන්තර්ගත කළ හැකි පාදයක දිග 10 cm වන උපරිම සමචතුරස්‍ර ගණන කීය ද?
(1) 50 (2) 48 (3) 47 (4) 45 (5) 42


**25.** විෂයයන් 8ක් සඳහා අරුණගේ සාමාන්‍ය ලකුණ 70 වේ. එක් විෂයයකට ඔහු ලකුණු 84ක් ලබා ගෙන ඇත්නම්, ඉතිරි විෂයයන් 7 සඳහා ඔහුගේ සාමාන්‍ය ලකුණ කීය ද?
(1) 58 (2) 68 (3) 70 (4) 72 (5) 84

**26.** 40 km $h^{-1}$ ක සාමාන්‍ය වේගයකින් ගමන් කරන දුම්රියක් *A* දුම්රියපොළේ සිට 30 km ක දුරකින් පිහිටි ඊළඟ දුම්රියපොළ වන *B* වෙත යෑමට පෙ.ව. 7.00 ට *A* දුම්රියපොළෙන් පිටත් වෙයි. *A* සිට *B* දක්වා ගමන් කරන ඊළඟ දුම්රිය 50 km $h^{-1}$ ක සාමාන්‍ය වේගයකින් ගමන් කරන්නේ නම්, එම දුම්රිය, පළමු දුම්රිය *B* වෙත ළඟා වී මිනිත්තු 5 කට පසු *B* වෙත ළඟා වීමට, *A* වලින් පිටත් විය යුතු වේලාව කුමක් ද?
(1) පෙ.ව. 7.14 (2) පෙ.ව. 7.15 (3) පෙ.ව. 7.16 (4) පෙ.ව. 7.18 (5) පෙ.ව. 7.20


**27.** වෑන් රථයකට වර්ග දෙකක පෙට්ටි පටවා ඇත. පෙට්ටිවල මුළු ස්කන්ධය 1000 kg කි. පළමු වර්ගයේ එක් එක් පෙට්ටියේ ස්කන්ධය 7 kg ද දෙවන වර්ගයේ එක් එක් පෙට්ටියේ ස්කන්ධය 8 kg ද වේ. වෑන් රථය තුළ පළමු වර්ගයේ පෙට්ටි 130 කට වඩා වැඩියෙන් ඇති බව කාංචනා දනී. දෙවන වර්ගයේ පෙට්ටි කොපමණ සංඛ්‍යාවක් වෑන් රථය තුළ තිබේ ද?
(1) 3 (2) 4 (3) 5 (4) 6 (5) 7

**28.** නිවසේ සිට පාසලට යන අමිලට 5 km $h^{-1}$ ක සාමාන්‍ය වේගයෙන් ඇවිද යෑම වෙනුවට 15 km $h^{-1}$ ක සාමාන්‍ය වේගයෙන් පා පැදියක් පැද යෑමෙන්, මිනිත්තු 12ක කාලයක් ඉතිරි කර ගත හැකි ය. ඔහුගේ නිවසේ සිට පාසලට ඇති දුර කොපමණ ද?
(1) 0.5 km (2) 1.0 km (3) 1.5 km (4) 2.0 km (5) 2.5 km

**29.**





ඉහත දී ඇති රූපයේ දර්පණ ප්‍රතිබිම්බය කුමක් ද?



(1) (2) (3) (4) (5)

**30.** Ⓟ, Ⓠ හා Ⓡ තල රූප තුනෙහි එක ම අක්ෂරය මගින් දක්වා ඇති පැති එකට සම්බන්ධ කිරීමෙන් පහත කුමන හැඩය ලබා ගත හැකි ද?



(1) (2) (3) (4) (5)



Department of Examinations, Sri Lanka


**31.** අඹ වෙළෙන්දෙක් සඳුදා සිට සිකුරාදා දක්වා අඹ විකුණයි. මෙම දින පහ තුළ ඔහු විකුණූ මුළු අඹ ගෙඩි සංඛ්‍යාව 310කි. සඳුදා හැර අනෙක් ඕනෑ ම දිනක විකුණූ අඹ ගෙඩි සංඛ්‍යාව, ඊට පෙර දින විකුණූ අඹ ගෙඩි සංඛ්‍යාවෙන් හරි අඩකි. මේ වෙළෙන්දා බ්‍රහස්පතින්දා දිනයේ විකුණූ අඹ ගෙඩි සංඛ්‍යාව කොපමණ ද?

(1) 10 (2) 20 (3) 40 (4) 80 (5) 120

- අංක **32** සිට **34** තෙක් ප්‍රශ්න, පහත දී ඇති තොරතුරු මත පදනම් වේ.

මිනිස් ශ්‍රමය වැඩි වශයෙන් යොදා ගන්නා කර්මාන්තශාලාවක නිෂ්පාදන අංශයක සේවකයන් ක්‍රමයෙන් නිපුණතා අත්කර ගැනීම හේතුවෙන්, කාලයත් සමග නිෂ්පාදන කාර්යක්ෂමතාව ඉහළ යයි. එක ම සම්පත් භාවිත කර එක ම භාණ්ඩය නිෂ්පාදනය කරන නිෂ්පාදන අංශ දෙකක කාර්යක්ෂමතා වක්‍ර මෙම ප්‍රස්තාරයේ දැක්වේ.

3 වැනි දින පළමු අංශයෙහි නිෂ්පාදනය කළ ප්‍රමාණය ඒකක 600 බව සොයාගෙන ඇත.




**32.** 4 වැනි දිනය තුළ දෙවැනි අංශයෙහි කොපමණ ඒකක සංඛ්‍යාවක් නිෂ්පාදනය කොට තිබේ ද?

(1) 400 (2) 600 (3) 800 (4) 1000 (5) 1200

**33.** පළමු දින හතර අවසානයේ දී පළමු සහ දෙවැනි අංශවල නිෂ්පාදනය කරන ලද ඒකක සංඛ්‍යා පිළිවෙළින් $U_1$ සහ $U_2$ වූයේ නම්, $U_1 : U_2$ අනුපාතය කොපමණ ද?

(1) 1 : 1 (2) 1 : 2 (3) 2 : 1 (4) 3 : 1 (5) 1 : 3

**34.** මෙම කර්මාන්තශාලාවට ලැබෙන එක්තරා ඇණවුමක් මුළුමනින් ම එක් නිෂ්පාදන අංශයක පමණක් නිෂ්පාදනය කිරීමට සිදු වී තිබේ. එම කාර්යක්ෂමතා වක්‍ර ම භාවිත කරමින්, අදාළ ඇණවුම් ප්‍රමාණය පළමු අංශයෙහි නිපයනු වෙනුවට දෙවැනි අංශයෙහි නිපැයීමෙන් එක් දිනයක් කලින් බාර දිය හැකි බව නිෂ්පාදකයා නිමානය කරයි. මෙම ඇණවුමෙහි ප්‍රමාණය පහත කුමක් විය හැකි ද?

(1) ඒකක 500 (2) ඒකක 1000 (3) ඒකක 1500 (4) ඒකක 2000 (5) ඒකක 2500

- අංක **35** සහ **36** ප්‍රශ්න, පහත දී ඇති තොරතුරු මත පදනම් වේ.

අමල්, භවන් සහ කාසිම් පා ගමනක යෙදුණෝ ය. අමල් පළමු කිලෝමීටර 3 තුළ කුඩාරමක් ඔසවාගෙන ගිය අතර, ඉන් පසු භවන් එය කිසියම් දුරක් ඔසවාගෙන ගොස්, අනතුරුව කඳවුරු බිම කරා යන අවසන් කිලෝමීටර 5 තුළ කාසිම් එය ඔසවාගෙන ගියේ ය. පසු දා උදෑසන ආපසු එන ගමනේ දී පළමු කිලෝමීටර 4 තුළ කුඩාරම ඔසවාගෙන ආ අමල්, ඉන් පසු එය කිසියම් දුරක් ඔසවාගෙන ඒමට කාසිම්ට දුන් අතර අවසන් කිලෝමීටර 5 තුළ භවන් එය ඔසවාගෙන ආවේ ය.

**35.** භවන් සහ කාසිම් කුඩාරම ඔසවාගෙන ගිය දුර ප්‍රමාණ අතර වෙනස කිලෝමීටරවලින් කොපමණ ද?

(1) 0 (2) 1 (3) 2 (4) 3 (5) 4

**36.** *A*, *B* සහ *C* මගින් අනුපිළිවෙළින් අමල්, භවන් සහ කාසිම් කුඩාරම ඔසවාගෙන ඇවිද ගිය දුර ප්‍රමාණ දක්වයි නම්, පහත කවරක් **අත්‍යවශ්‍යයෙන් ම වැරදි** විය යුතු ද?

(1) $A > B > C$ (2) $A < B > C$ (3) $A > B < C$ (4) $A = B > C$ (5) $A = C < B$

- අංක **37** සහ **38** ප්‍රශ්න, පහත දී ඇති තොරතුරු මත පදනම් වේ.

සෝමා සීනි තේ හැඳි එකක් දිය කොට උදෑසන තේ පානය කළා ය. දිවා ආහාරයට පළමු ඇ සීනි අන්තර්ගතය 100 ml ට 10 g ක් වූ ඉඟුරු-බීර පානයකින් 75 ml ක් පානය කළා ය. දෛනික සීනි පරිභෝජනය 20 g ට සීමා කරන ලෙස සෝමාගේ වෛද්‍යවරයා ඇයට නිර්දේශ කොට තිබේ. දැන් සෝමා සවස තේ වේලාවට පානය කිරීමට යමක් සිතා බලන්නී ය.

**37.** සෝමා තේ බීමට සිතන්නී නම්, ඇයට ඊට එක් කළ හැකි සීනි තේ හැඳි ප්‍රමාණය කොපමණ ද?
(සීනි තේ හැඳි 1 = සීනි 5 g)

(1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 5

**38.** තේ වෙනුවට, සීනි අන්තර්ගතය 100 ml ට 15 g ක් වූ ලෙමනේඩ් පානය කිරීමට සෝමා කැමැත්ත දක්වයි නම්, ඇයට එම පානයෙන් කොතරම් ප්‍රමාණයක් බීමට හැකි වේ ද?

(1) 50 ml (2) 75 ml (3) 100 ml (4) 150 ml (5) 200 ml



Department of Examinations, Sri Lanka

Past Papers Wiki

**39.** ගුරුවරුන් 5 දෙනකු *A* පාසලෙන් *B* පාසලට මාරු කළ පසු පාසල් දෙකේ ම සිටින ගුරුවරුන් ගණන සමාන විය. පහත දී ඇති ප්‍රකාශවලින් **අනිවාර්යයෙන් ම සත්‍ය** වන ප්‍රකාශ මොනවා ද?

(P) - මාරු කිරීමට පෙර *B* ට වඩා වැඩියෙන් ගුරුවරු 5 දෙනෙක් *A* හි සිටියෝ ය.
(Q) - මාරු කිරීමට පෙර *B* ට වඩා වැඩියෙන් ගුරුවරු 10 දෙනෙක් *A* හි සිටියෝ ය.
(R) - මාරු කිරීමෙන් පසු *B* හි සිටින ගුරුවරුන් ගණන ඉරට්ටේ සංඛ්‍යාවකි.
(S) - පාසල් දෙකෙහි ම සිටින මුළු ගුරුවරුන් සංඛ්‍යාව 10 ට වඩා වැඩි ය.

(1) (P) සහ (Q) (2) (Q) සහ (S) (3) (R) සහ (S)
(4) (P) සහ (R) (5) (P), (Q) සහ (R)

**40.** පැය 24ක් ඇතුළත ඉපදුණු නිවුන් දැරියන් දෙදෙනකුගේ උපන් දින විය **නොහැක්කේ** පහත කවරක් ද?

(1) ජනවාරි 21 සහ ජනවාරි 21 (2) ජනවාරි 30 සහ පෙබරවාරි 01
(3) පෙබරවාරි 28 සහ මාර්තු 01 (4) ජූලි 31 සහ අගෝස්තු 01
(5) දෙසැම්බර් 31 සහ ජනවාරි 01

● අංක **41** සහ **42** ප්‍රශ්න සඳහා, පොලිස් ප්‍රශ්න කිරීමක දී පොලිස් නිලධාරියකු විසින් අසනු ලැබූ ප්‍රශ්න 6ක් සහ ඊට සාක්ෂිකරුවකු දුන් පිළිතුරු 6ක් ඇතුළත් පහත දෙබස සලකන්න.

1 වන ප්‍රශ්නය – තමන් ඔහු ව අන්තිම වතාවට දැක්කේ කවදා ද?
1 වන පිළිතුර – මාස දෙකකට කලින්.
2 වන ප්‍රශ්නය – එතකොට ඔහු තමා ව අඳුනාගත්තා ද?
2 වන පිළිතුර – නැහැ. ඔහුගේ ඇස් පෙනීම සම්පූර්ණයෙන් ම වාගේ නැති වෙලා තිබුණා.
3 වන ප්‍රශ්නය – තමන් කොහෙ දි ද ඔහු ව දුටුවේ?
3 වන පිළිතුර – පසුගිය ම.වා.ම. - මහනුවර වාර්ෂික මල් දැක්මෙ දි.
4 වන ප්‍රශ්නය – ඔහු මල් මොකුත් මිලට ගත්තා ද?
4 වන පිළිතුර – නැහැ. ඔහු ඒවගේ පාට ගැන පැහැදුණේ නැහැ.
5 වන ප්‍රශ්නය – තමන්ට ඔහු ව නැවත දකින්න ලැබෙනවා ද?
5 වන පිළිතුර – ඔව්, සති තුනක කාලයකින්.
6 වන ප්‍රශ්නය – ඒ කොහෙ දි ද?
6 වන පිළිතුර – ඊළඟ ම.වා.ම. දැක්මෙ දි.

**41.** පළමු පිළිතුරු තුන සත්‍ය නම්, **අනිවාර්යයෙන් ම අසත්‍ය** වන පිළිතුරු කොපමණ තිබේ ද?

(1) 0 (2) 1 (3) 2 (4) 3 (5) 4

**42.** සත්‍ය විය හැකි පිළිතුරු උපරිම ගණන කොපමණ ද?

(1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 5

● අංක **43** සහ **44** ප්‍රශ්න, පහත සඳහන් ඡේදය හා වගුව මත පදනම් වේ.

අඹගමුවේ සිට කෙසෙල්ගමුව දක්වා යන ගමන, අඹගමුව දුම්රියපොළ සිට දඹගමුව දුම්රියපොළ දක්වා පැයක දුම්රිය ගමනකින් ද දඹගමුව දුම්රියපොළ සිට නාරංගමුව බස් නැවතුම දක්වා මිනිත්තු 15ක බස් ගමනකින් ද අවසානයේ නාරංගමුව බස් නැවතුමේ සිට කෙසෙල්ගමුව දක්වා මිනිත්තු 5ක ත්‍රිරෝද රථ ගමනකින් ද සමන්විත වේ. දුම්රිය සහ බස් රිය පිටත්වීමේ කාල සටහන් මෙහි දී ඇත. දවසේ ඕනෑ ම වේලාවක නාරංගමුව බස් නැවතුමෙන් ත්‍රිරෝද රථයක් සොයා ගැනීමට හැකි වෙයි. මඟීන් ඉක්මනින් ම තමාට ලබා ගත හැකි මීළඟ ප්‍රවාහන පහසුකම සලසාගන්නා බව උපකල්පනය කෙරේ.

| දුම්රිය | බස් රිය |
|---|---|
| අඹගමුවෙන් පිටත්වීම | දඹගමුවෙන් පිටත්වීම |
| පෙ.ව. 8.00 | පෙ.ව. 9.05 |
| පෙ.ව. 8.10 | පෙ.ව. 9.10 |
| පෙ.ව. 8.15 | පෙ.ව. 9.25 |
| පෙ.ව. 8.25 | පෙ.ව. 9.30 |
| පෙ.ව. 8.35 | පෙ.ව. 9.40 |

**43.** දෙල්ගොඩ මහතා අඹගමුවේ සිට කෙසෙල්ගමුව දක්වා සිය ගමනට පැය 1යි මිනිත්තු 30ක් ගත කළේ ය. ඔහු ගමන් කළ දුම්රිය අඹගමුව දුම්රියපොළෙන් පිටත් වූ වේලාව කුමක් ද?

(1) පෙ.ව. 8.00 (2) පෙ.ව. 8.10 (3) පෙ.ව. 8.15 (4) පෙ.ව. 8.25 (5) පෙ.ව. 8.35

**44.** පනාගොඩ මහත්මිය අඹගමුව දුම්රියපොළට පැමිණියේ වනසිංහ මහතාට මිනිත්තු 14 කට පෙරාතුව ය. කෙසේ හෝ, මේ දෙදෙනා ම එක ම වේලාවට කෙසෙල්ගමුවට ළඟා වූහ. පෙ.ව. 8.00 ට අඹගමුව දුම්රියපොළෙන් පිටත් වූ පුහුල්ගොඩ මහතා මේ දෙදෙනා එන තුරු කෙසෙල්ගමුවේ බලා සිටියේ ය. පුහුල්ගොඩ මහතාට කොපමණ වේලාවක් එසේ බලා ඉන්නට සිදු වී ද?

(1) මිනිත්තු 5 (2) මිනිත්තු 10 (3) මිනිත්තු 15 (4) මිනිත්තු 20 (5) මිනිත්තු 25

**45.** 'අරුම සියොතුන්' යන පක්ෂි විශේෂය පියඹා යන්නේ ප්‍රධාන භූමියේ සිට දූපත් කරා යැයි කියනු ලැබේ.
පහත කවර ප්‍රකාශය සත්‍ය වුවහොත් ඉහත කියන ලද්දෙහි විශ්වසනීයත්වය බෙහෙවින් ම අඩු වේ ද?

(1) කයිට්ස් දූපතෙහි සිටිනවාට වඩා අරුම සියොත්හු යාපනයේ සිටිති.
(2) ඉන්දියාවේ සිටිනවාට වඩා අරුම සියොත්හු ශ්‍රී ලංකාවේ සිටිති.
(3) යාපනයේ සිට කයිට්ස් දූපත බලා අරුම සියොතුන් පියඹා යනු දැක තිබේ.
(4) ශ්‍රී ලංකාවේ සිට ඉන්දියාව බලා අරුම සියොතුන් පියඹා යනු දැක තිබේ.
(5) අරුම සියොතුන්ට දියට උඩින් පියඹා යා නොහැකි ය.



Department of Examinations, Sri Lanka

**46.** සංකල්පීය ව වෙනස් අනුක්‍රමය තෝරන්න.
(1) ආසියාව ⟶ ශ්‍රී ලංකාව ⟶ බස්නාහිර පළාත ⟶ කොළඹ
(2) ප්‍රෝටෝනය ⟶ න්‍යෂ්ටිය ⟶ පරමාණුව ⟶ පදාර්ථය
(3) සමුද්‍රය ⟶ ගංගාව ⟶ දොළ ⟶ උල්පත
(4) මාධ්‍ය ⟶ පුවත්පත ⟶ අතිරේකය ⟶ සිනමා පිටුව
(5) වනය ⟶ ගස ⟶ ඵලය ⟶ බීජය

● අංක **47** සහ **48** ප්‍රශ්න සඳහා පහත දී ඇති ඡේදය කියවන්න.

මානව ප්‍රතිශක්ති ඌනතා වෛරසය හා නතුකරගත් ප්‍රතිශක්ති ඌනතා සහලක්ෂණය පිළිවෙළින් HIV හා AIDS ලෙස කෙටියෙන් හැඳින්වේ. පුද්ගලයකුගේ ශරීරය තුළට HIV ඇතුළු වූ විට ඔහු හෝ ඇය HIV ආසාදනයට ලක් වෙයි. මෙම වෛරසය පුද්ගලයකුගේ ප්‍රතිශක්තිකරණ හැකියාව දුර්වල කරන අතර එහි ප්‍රතිඵලයක් ලෙස අනෙකුත් ක්ෂුද්‍රජීවීන් හේතුකොට ගෙන ඇති වන ආසාදනයන්ගෙන් රෝග හටගැනීමේ අවදානම වැඩි කෙරේ. HIV ආසාදනයේ ආරම්භක අවස්ථාවේ සිට වෙනත් රෝගවල ලක්ෂණ පෙන්නුම් කිරීමට වසර 8 – 10 ක පමණ කාලයක් ගත විය හැකි ය. පුද්ගලයකුගේ ශරීරයේ ප්‍රතිශක්තිකරණය හීන වීමේ ප්‍රතිඵලයක් ලෙස වෙනත් රෝගවල ලක්ෂණ ඉස්මතු වීමේ අවධිය එම පුද්ගලයාට AIDS වැළඳී ඇති අවධිය ලෙස සැලකේ. HIV ආසාදිත පුද්ගලයකු මගින් හෝ AIDS වැළඳී ඇති පුද්ගලයකු මගින් හෝ තවත් පුද්ගලයකු HIV ආසාදනයට ලක් විය හැකි ය. බොහෝ අවස්ථාවල පුද්ගලයකුට HIV ආසාදනය වන්නේ HIV ආසාදිත පුද්ගලයකු සමග සිදු කෙරෙන අනාරක්ෂිත ලිංගික සබඳතාවකින් හෝ HIV ආසාදිත පුද්ගලයකුගේ රුධිරයෙන් සිදු කෙරෙන රුධිර පාරවිලයනය හරහා හෝ HIV ආසාදිත මවකට දරුවකු ලෙස ඉපදීමෙන් හෝ වේ.

**47.** ඉහත ඡේදයේ සවිස්තරාත්මක ව ප්‍රකාශ **නොකෙරන්නේ** පහත කුමක් ද?
(1) ලිංගික නොවන සම්බන්ධතාවක් මගින් පුද්ගලයකුට AIDS වැළඳිය හැකි ය.
(2) AIDS රෝග ලක්ෂණ රහිත HIV ආසාදිත පුද්ගලයකු සිටිය හැකි ය.
(3) පුද්ගලයකු HIV ආසාදිත පුද්ගලයකු සමග සිදු කරන ලිංගික සබඳතාවල දී ආරක්ෂිත පූර්වෝපායන් ගනු ලබන්නේ නම්, එම පුද්ගලයා HIV ආසාදනයට ලක් නොවිය හැකි ය.
(4) ප්‍රතිශක්තිකරණයට ක්ෂුද්‍රජීවීන් හේතුවෙන් ඇති වන බොහෝ රෝග වළක්වා ගැනීමට හැකියාව ඇත.
(5) HIV පමණක් නොව අනෙකුත් ක්ෂුද්‍රජීවීන් ද ලිංගික රෝග සඳහා හේතු විය හැකි ය.

**48.** මෙම ඡේදය ප්‍රකාශ කරන්නේ,
(1) විවිධ ආකාරවල ලිංගික රෝග පිළිබඳ ව ය.
(2) මවකගෙන් දරුවකුට HIV සංක්‍රමණය වන වෙනස් ආකාර පිළිබඳ ව ය.
(3) HIV සහ AIDS හි අර්ථ හා ඒවා අතර ඇති සම්බන්ධතාව පිළිබඳ ව ය.
(4) HIV ආසාදනයෙන් පසු AIDS පෙන්වීමට දිගු කාල පරිච්ඡේදයක් ගන්නේ ඇයි යන්න පිළිබඳ ව ය.
(5) AIDS රෝග ලක්ෂණ පෙන්වන පුද්ගලයකුගෙන් පමණක් නවක පුද්ගලයකු HIV ආසාදනයට ලක් විය හැකි බව පිළිබඳ ව ය.

● අංක **49, 50** සහ **51** යන ප්‍රශ්නවල නිගමනයක් ද I, II හා III ලෙස අංක කරන ලද ප්‍රකාශ මගින් දැක්වෙන තොරතුරු සමූහයක් ද දී ඇත.

* එක් ප්‍රකාශයකින් පමණක් නිගමනයට එළඹිය හැකි නම් *A* තෝරන්න.
* I හා II එකවර භාවිත කිරීමෙන් නිගමනයට එළඹිය හැකි නම් *B* තෝරන්න.
* I හා III එකවර භාවිත කිරීමෙන් නිගමනයට එළඹිය හැකි නම් *C* තෝරන්න.
* II හා III එකවර භාවිත කිරීමෙන් නිගමනයට එළඹිය හැකි නම් *D* තෝරන්න.
* I, II හා III එකවර භාවිත කිරීමෙන් නිගමනයට එළඹිය හැකි නම් *E* තෝරන්න.

**49.** නිගමනය : මිනිස් ක්‍රියාකාරකම් නිසා පරිසරය දූෂණය වේ.
I. හරිතාගාර වායු වැනි පරිසර දූෂක ද්‍රව්‍ය නිපදවීම සම්බන්ධ ව මිනිසා වගකිව යුතු වේ.
II. මානව පරිසරය ප්‍රධාන වශයෙන් සමන්විත වන්නේ භූමියෙන්, ජලයෙන්, වාතයෙන් සහ ජීවීන්ගෙනි.
III. සාගර, වන ආවරණ සහ වගා කළ ඉඩම් හරිතාගාර වායු ස්වාභාවික ව රඳවා ගන්නා ස්ථාන වේ.
(1) *A* (2) *B* (3) *C* (4) *D* (5) *E*

**50.** නිගමනය : ශ්‍රී ලංකාවේ මෝටර් වාහන ගහනයෙන් හරි අඩකට වඩා ඇත්තේ යතුරු පැදි ය.
I. 'යතුරු පැදි', 'මෝටර් රථ', 'ත්‍රිරෝද රථ' සහ 'වෙනත් වාහන' ලෙස ආකාර හතරකට මෝටර් වාහන වර්ගීකරණය කර ඇත.
II. ශ්‍රී ලංකාවේ ඇති මුළු මෝටර් වාහන ගහනයෙන් ප්‍රතිශතයක් ලෙස ගත් විට ත්‍රිරෝද රථ, මෝටර් රථ, සහ වෙනත් වාහන පිළිවෙළින් 17%, 11% සහ 19% වේ.
III. ශ්‍රී ලංකාවේ මුළු මෝටර් වාහන ගහනය මිලියන 6 ඉක්මවයි.
(1) *A* (2) *B* (3) *C* (4) *D* (5) *E*

**51.** නිගමනය : මීතොටමුල්ලේ කසළ කන්ද බිඳවැටීම මිනිස් ක්‍රියාකාරකම් නිසා සිදු වූ ව්‍යසනයකි.
I. අදාළ ආයතන නගරයේ එකතු වන කසළ මීතොටමුල්ලේ ගොඩගැසුවේ ය.
II. වරින් වර ඇදහැළුණු වර්ෂාව නිසා සහ උණුසුම් කාලගුණය නිසා අණුක ජීව ක්‍රියාකාරකම් වැඩි වී තිබුණි.
III. සැලසුම් සහගත නොවන ක්‍රියාකාරකම් නිසා, ගොඩගැසුණු කසළ ප්‍රමාණය භූමියට දරාගත හැකි ප්‍රමාණය ඉක්මවා ගොස් තිබුණි.
(1) *A* (2) *B* (3) *C* (4) *D* (5) *E*

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka
PAST PAPERS WIKI

[හත්වැනි පිටුව බලන්න.

Past Papers Wiki



● අංක **52** හා **53** ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට, පහත දී ඇති සංඥා අධ්‍යයනය කරන්න.



*A* *B* *C* *D* *E* *F*

**52.** *a* සිට *d* දක්වා පහත දී ඇති ඒවා එම අනුපිළිවෙළට ම නිරූපණය කෙරෙන සංඥාවලට අනුරූප වන ඉංග්‍රීසි ලොකු අක්ෂර හතර පෙළගස්වන්න.

*a* - අන්ධ පුද්ගලයින් පාර හරහා මාරුවන ස්ථානය ඉදිරියෙනි  *b* - මිනිසුන් වැඩෙහි යෙදෙන ස්ථානය ඉදිරියෙනි
*c* - බෝක්කුව හෝ පටු පාලම ඉදිරියෙනි  *d* - ගේට්ටු සහිත දුම්රිය හරස් මාර්ගය ඉදිරියෙනි


(1) *B, E, A, F* (2) *D, B, A, F* (3) *C, E, A, F* (4) *C, B, E, F* (5) *D, E, A, F*

**53.** පදිකයන් මහාමාර්ගය හරහා මාරුවන ස්ථානයක් හා සමීපයේ පාසලක් හෝ ක්‍රීඩාපිටියක් ඇති බව දැක්වෙන සංඥා දෙක මොනවා ද?


(1) *B* සහ *C* (2) *B* සහ *E* (3) *C* සහ *E* (4) *B* සහ *D* (5) *C* සහ *D*

**54.** 2010-2016 කාල පරිච්ඡේදය තුළ එක් එක් වර්ෂයේ දී ශ්‍රී ලංකා කණ්ඩායම ඔවුන් ක්‍රීඩා කළ මුළු එක්දින ජාත්‍යන්තර ක්‍රිකට් තරගවලින් ජයග්‍රහණය කළ ක්‍රිකට් තරග ප්‍රතිශතය මෙම ප්‍රස්තාරයෙන් දැක්වේ. ශ්‍රී ලංකා කණ්ඩායම ඔවුන් ක්‍රීඩා කළ තරගවලින් අවම වශයෙන් හරි අඩක්වත් ජයග්‍රහණය කළේ පහත දැක්වෙන කුමන වර්ෂවල ද?

(1) 2010, 2011 සහ 2014
(2) 2010 සහ 2014
(3) 2010, 2011, 2014 සහ 2015
(4) 2012, 2013, 2015 සහ 2016
(5) 2010 සහ 2014 හැර අනෙකුත් සියලු ම වර්ෂවල




**55.** කිසියම් සිද්ධියකට අදාළ පින්තූර හයක් පහත දී ඇත. පින්තූරවල නිවැරදි අනුපිළිවෙළ පෙළගස්වන වරණය තෝරන්න.



(A) (B) (C) (D) (E) (F)

(1) ACBFED (2) ACBDEF (3) CBADFE (4) ACBDFE (5) ABCDEF



Department of Examinations, Sri Lanka

● අංක **56** , **57** හා **58** යන ප්‍රශ්න පහත දී ඇති තොරතුරු මත පදනම් වේ.

ලියුම් බෙදන්නකු හා කාන්තාවක අතර එම කාන්තාවගේ නිවසේ දී ඇති වූ සංවාදයක කොටස් අනුපිළිවෙළින් තොරව පහත දී ඇත.

*A* - සුබ උදෑසනක්, තැපැල් මහත්මයා. එය සාමාන්‍ය ලිපියක් ද නැත්නම් ලියාපදිංචි ලිපියක් ද?
*B* - සුබ උදෑසනක්, මහත්මියනි.
*C* - ගැටලුවක් නැහැ, මහත්මියනි.
*D* - මම දැන් ලෑස්තියි. කරුණාකර ලියුම මගේ අතට දෙන්න.
*E* - මහත්මියනි මේ කඩදාසියේ අත්සන් කරන්න, ඔබට ලියුම ලැබුණු බව පෙන්වීමට.
*F* - මෙන්න මම අත්සන තියනවා.
*G* - මහත්මියනි, එය ලියාපදිංචි ලිපියක්.
*H* - මට අත් සෝදාගන්න ඕනැ. කරුණාකර ටික වෙලාවක් ඉන්න පුළුවන් ද?
*I* - මෙන්න මම ඔබට බාර දෙනවා.
*J* - ස්තුතියි.
*K* - ස්තුතියි. මහත්මියට සුබ දවසක් වේවා!
*L* - ඔබටත් සුබ දවසක් වේවා!

**56.** සංවාදයෙහි වඩාත් තර්කානුකූල අනුපිළිවෙළ දැක්වෙන වරණය තෝරන්න.

(1) *ABHGDCIJEFLK* (2) *ABHGDCIJFEKL* (3) *BAHGDCIJEFKL*
(4) *BAGHCDIJEFKL* (5) *BAGHCDIJFELK*

**57.** ලියුම් බෙදන්නා විසින් රැගෙන එන ලද ලිපිය ලියාපදිංචි ලිපියක් බව හැඟවෙන කොටස් දෙක මොනවා ද?

(1) *A* සහ *B* (2) *A* සහ *H* (3) *E* සහ *I* (4) *G* සහ *H* (5) *E* සහ *G*

**58.** ලියුම් බෙදන්නා විසින් රැගෙන එන ලද ලිපිය සාමාන්‍ය ලිපියක් නම්, ඉහත සංවාදයේ අදාළ නොවන කොටස් දෙකක් වන්නේ,

(1) *B* සහ *H* ය. (2) *H* සහ *K* ය. (3) *E* සහ *F* ය. (4) *E* සහ *L* ය. (5) *F* සහ *L* ය.

● අංක **59** හා **60** යන එක් එක් ප්‍රශ්නයේ වගන්ති තුන බැගින් ඇති කෙටි ඡේද පහක් දී ඇත. ඉන් එක් ඡේදයක පමණක්, දී ඇති වගන්ති තුන තර්කානුකූල සම්බන්ධයක් දැක්වෙන පරිදි නැවත සකස් කළ හැකි ය. තර්කානුකූල සම්බන්ධයක් දැක්වෙන පරිදි නැවත සකස් කළ හැකි වගන්ති සහිත ඡේදය තෝරන්න.

**59.** (1) අජිත් පෙරේරා ජාතික මට්ටමේ ක්‍රිකට් පුහුණුකරුවෙකි. පෙරේරා මහතාගේ පුතා පාසලේ පැසිපන්දු නායකයා වන අතර දියණිය දැල්පන්දු නායිකාව වන්නී ය. පියාගේ දක්ෂතා ඔහුගේ ළමයින් තුළ ද දක්නට ලැබේ.

(2) සිමෙන්ති, ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන අතර පිටරටින් ආනයනය ද කෙරේ. සිමෙන්ති නිෂ්පාදනය සඳහා අවශ්‍ය ප්‍රධාන අමුද්‍රව්‍යය හුනුගල් ය. හුනුගල් ශ්‍රී ලංකාවේ ස්වාභාවික වශයෙන් තිබේ.

(3) පොල් ශ්‍රී ලංකාවේ ආහාර බෝගයකි. ගෙවතුවල මෙන් ම විශාල වතු ලෙස ද පොල් වගා කරනු ලැබේ. පොල් වතුවලින් වැඩි ප්‍රමාණයක් පුත්තලම, කුරුණෑගල හා ගම්පහ දිස්ත්‍රික්කවල ඇත.

(4) කඩදාසි නිෂ්පාදනයේ දී ශාක අමුද්‍රව්‍යවලින් සාදනු ලබන දියරමය පල්පය, ඇලෙනසුලු ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා පළමු ව පිරියම් කරනු ලැබේ. ජලය ඉවත් කිරීමෙන් අනතුරුව උකු පල්පය වියළනු ලැබේ. පල්පය විරංජනය කර පිරවුම් ද්‍රව්‍ය එකතු කර ජලය ඉවත් කිරීම සඳහා රෝලරය මගින් සම්පීඩනය කරනු ලැබේ.

(5) දිනකට මරණ 4 යන අනුපාතයෙන් ශ්‍රී ලංකාවේ මාරක රිය අනතුරු සිදු වේ. වේගය මරු කැඳවයි. මාරාන්තික රිය අනතුරු ප්‍රධාන වශයෙන් සිදු වන්නේ රිය පැදවීමේ දී ඇති වන නිදිමත ගතිය හේතුවෙනි.

**60.** (1) වර්තමානයේ රජයේ පාසල්වල තුන්වන ශ්‍රේණියේ සිට ඉහළට ඉංග්‍රීසි භාෂාව විෂයයක් ලෙස උගන්වනු ලැබේ. 1 සහ 2 ශ්‍රේණිවලට ගැළපෙන පෙළ පොත් ලිවීම හා ගුරුවරුන් පුහුණු කිරීම ආරම්භ කර ඇත. ඉදිරියේ දී 1 සහ 2 ශ්‍රේණිවලට විෂයයක් වශයෙන් ක්‍රියාකාරකම් පාදක කථන ඉංග්‍රීසි ප්‍රචලිත කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය පියවර ගනිමින් සිටියි.

(2) රජය, ගවයන් බෝ කිරීම දිරි ගන්වයි. එළදෙනක් දිනකට කිරි ලීටර 20ක් දක්වා ලබා දෙයි. කිරි පරිපූර්ණ ආහාරයකි.


(3) ජංගම දුරකථනය ඇමතුම් උපාංගයක් පමණක් නොව ජාල පද්ධතියක කොටසක් ද වේ. අත් ඔරලෝසුව වේලාව දක්වන්නක් පමණක් නොව ආභරණයක් ද වේ. ස්වර්ණාභරණ යනු ආකර්ෂණීය සැරසිල්ලක් පමණක් නොව ආයෝජනයක් ද වේ.


(4) බොහොමයක් මල් උදය කාලයේ පිපෙයි. සුදු මල් රාත්‍රියට සහ උදෑසනට පිපෙයි. රාත්‍රියට පිපෙන මල් සුවඳවත් ය.

(5) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ඉදිරි පැය 48 තුළ වර්ෂාව ඇති වන බවට අනාවැකි පළ කරයි. අධික වර්ෂාව සමග තද සුළං, විදුලි කෙටීම් සහ අකුණු ගැසීම් ඇති වන බැවින් ධීවරයන්ට ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීමට නොයන ලෙස අවවාද කෙරේ. මිරිදිය ධීවරයෝ ද ඉස්සන් වගාවෙහි නියැලෙන්නෝ ද කාලගුණ අවවාද ගැන තැකීමක් නොකරති.

* * *

Department of Examinations, Sri Lanka


වාරෙටම ඕන කරන පොත්
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්
Store
25% OFF
ALL BOOKS
Including Exercise Books,
CR Books, and B5 Books
ම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්
ORDER BOOKS FROM LOL BOOKS STORE


ORDER GCE A/L
SHORT NOTES, MODEL,
REVISION BOOKS & PAST
PAPERS IN SINHALA, ENGLISH
& TAMIL MEDIUM
LOL
BOOK
STORE
CASH ON DELIVERY
AND KOKO PAYMENT
AVAILABLE
WHATSAPP - 0717774440
WEBSITE: WWW.LOL.LK
GET READY FOR YOUR A/Ls